පිටුව


1. හැඳින්වීම 03
2. දැක්ම 04
3. මෙහෙවර 05
4. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය 06
5. ප්‍රධාන නිලධාරි මණ්ඩලය 07
6. සංවිධාන ව්‍යුහය 08
7. සභාපතිතුමාගේ සමාලෝචනය 09-10
8. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 11-12
9. විගණන කළමනාකරණ කමිටු වාර්තාව 13
10. ක්‍රියාත්මක වන වැඩසටහන් 14-40
11. මූල්‍ය ප්‍රකාශන 41-48
    a. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
    b. ආදායම් හා වියදම් ගිණුම
    c. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
    d. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයය
12. රජයේ විගණන වාර්තාව 49-65

# හැඳින්වීම

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ

2008 අංක 36 දරණ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම හා එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.

# දැක්ම

"තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම.........."



# මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව
උණු පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ
නාගරික කලාපවල වැසියන්ගේ
නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා
ඒ හා සමගාමීව
ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන්
සවිබල ගැන්වීම"

# 2015

## 2015.01.01දින සිට 2015.12.31 දක්වා අධ්‍යක්‍ෂ මණ්ඩලය


| අනු අංක | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 1 | සභාපති | යු. ජේ. කුරුකුලරත්න මහතා | 2015.04.28 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | ආර්. එස්. කහවල මහතා | 2015.10.19 |
| 3 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩී. ඒ. පී. අබේසේකර මහතා | 2015.03.10 |
| 4 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නිහාල් ප්‍රනාන්දු මහතා | 2015.10.09 |
| 5 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එල්. එස් පලංසූරිය මහතා | 2015.03.31 |
| 6 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | කේ. ඒ. එස්. වල්පොල මිය | 2015.04.27 |
| 7 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩබ්. එම්. ගුණරත්න මහතා | 2015.03.13 |
| 8 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ආචාර්ය මහිම් මෙන්ඩිස් මහතා | 2015.03.13 |
| 9 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඊ.එල්.ඩබ්.සමරසිංහ මහතා | 2015.03.13 |
| 10 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා | 2015.05.12 |
| 11 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩී. ඒ. ගාමිණි මහතා | 2010.05.24 |
| 12 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ. සන්තියාගෝ මහතා | 2015.05.18 |

## 2015
## ප්‍රධාන නිලධාරි මණ්ඩලය

ප්‍රධාන නිලධාරි මණ්ඩලය 01.01.2015 සිට 31.12.2015 දක්වා

| අනු අංක | තනතුර | නම | පත්වු දිනය |
|---|---|---|---|
| 1 | සභාපති | යු. ජේ. කුරුකුලරත්න මහතා | 2015.04.28 |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් | ආර්. එස්. කහවල මහතා | 2015.10.19 |
| 3 | අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ) | වයි. ආර්. ද සිල්වා මහතා | 2011.11.01 |
| 4 | අධ්‍යක්ෂ (මුදල්) | එන්.පී.පී.ඩයස් මහතා | 2011.02.01 |
| 5 | අභ්‍යන්තර විගණක | එල්.ආර්.ඒ.ශාන්ත මහතා | 2011.02.01 |
| 6 | සහකාර අධ්‍යක්ෂ (නීති) | ඩී. ඒ. දේවිකා දිසානායක මිය | 2011.11.01 |
| 7 | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | කේ. කේ. ඩබ්. ටී. පී. ද සිල්වා මිය | 2011.11.01 |
| 8 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | ආර්. ඩී. එස්. සුසන්ත ප්‍රනාන්දු මහතා | 2014.05.26 |
| 9 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | ඒ. එම්. කේ. බණ්ඩාර අතාවුද මහතා | 2012.06.11 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | එම්. එස්. වී. විපුලගුණ මිය | 2012.08.08 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | ඩබ්. පී. යු. කේ. පෙරේරා මිය | 2014.11.10 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | ඒ. පී. ආර්. ඥානප්‍රිය මහතා | 2014.11.17 |

# 2015 සංවිධාන ව්‍යුහය



## සභාපතිතුමාගේ සමාලෝචනය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2008 අංක 36 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත මගින් ස්ථාපිත කරනු ලැබූ අතර, 2015 වර්ෂය අවසානය වන විට වර්ෂ 07 ක පමණ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. මෙම අධිකාරිය පිහිටුවීමේ අරමුණු වනුයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම තුළින් තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති වනු පිණිස අඩු පහසුකම් ජනාවාස වල ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම පිණිස වේ. ඉහත අරමුණු සපුරාලනු වස් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ආරම්භයේ සිට 2015 වර්ෂ අවසාන දක්වාත් මින් ඉදිරියටත් භෞතික හා මානව සංවර්ධන යන ප්‍රවේශයන් යටතේ වැඩසටහන් සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.

භෞතික සංවර්ධන වැඩසටහන් යටතේ සුනාමි උවදුරින් හා මුහුදු බාදනයෙන් පීඩිතයට පත් ප්‍රජාව සඳහා විසඳුම් ලබාදීම වෙනුවෙන් රු.මි.1255.57 ක පිරිවැයක් දරා ඉදි කරන ලද අඟුලාන සයුරුපුර මහල් නිවාස යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කර ප්‍රතිලාභීන් 223 කු සමඟ ගිවිසුම් අත්සන් කොට ජනතා අයිතියට පත් කිරීම 2015 වර්ෂය අවසාන වන විට සිදුකරන ලදි. තවද මෙම අඟුලාන සයුරුපුර මහල් නිවාස යෝජනා ක්‍රමය තුළින් අඟුලාන ස්වභාවික වෙරළ තීරයෙහි තාවකාලික පදිංචිකරුවන් නිදහස් කොට දැයට දායාද කිරීමට හැකිවීම අප ලද තවත් ජයග්‍රහණයකි.

හලාවත නරියාගොඩැල්ල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතියේ වැඩ අවසන් කොට ජනතා අයිතියට පත් කිරීම සිදු කිරීම අවසන් කර තිබූ අතර එහි යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ පානීය ජලය ලබා දීම, විදුලිය ලබා දීම හා මළ පවාහන කාණු පද්ධතියක් සකස් කිරීම යන කාර්යන් සඳහා සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කරවීම 2015 වර්ෂය තුළදී සිදු කර ඇත.

අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක නිවාස ඒකක 356 කින් සමන්විත මොරටුව ලුනාව මහල් නිවාස යෝජනා ක්‍රමයේ භෞතික ප්‍රගතිය 2015/12/31 දිනට 62% ක් වන අතර රු.මි.840.37 ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වී ඇත. එසේම ඉහත අරමුණින් ක්‍රියාත්මක කරන ලද තලවකැලේ ලිඳුල නාගරික ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතියේ 2015/12/31 දිනට 80% ක භෞතික ප්‍රගතියක් සහ රු.මි.77.21 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කිරීමට හැකි වී ඇත.

2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද ''ජනසෙවණ'' දිරිය නාගරික නිවාස වැඩසටහන I වන අදියර මගින් කොළඹ දිස්ත්‍රික්කය තුළ නිවාස ලාභීන් 252 කගේ නිවාස අවශ්‍යතාවය සපුරා ඇති අතර 2014 වර්ෂය අවසාන භාගයේ දී ආරම්භ කරන ලද ''ජනසෙවණ'' දිරිය නාගරික නිවාස වැඩසටහනේ II අදියර මගින් ප්‍රතිලාභීන් 180 දෙනෙකුට 6% සහනදායී වාර්ෂික පොළියක් යටතේ උපරිම ණය මුදල් රු.200,000 ක සීමාවකට යටත්ව නිවාස ණය ලබා දීම සිදු කළ අතර 2015/12/31 දිනට 90% ක ප්‍රගතියක් වාර්තා කරන ලදි.

මානව සංවර්ධන වැඩසටහන 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ නාගරික ජනාවාසවල ජීවත්වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කොට ගත් වැඩසටහන් රාශියක් ඉතා උත්කර්ෂවත් ලෙස සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ අතර ලෝක ළමා දිනය සැමරීම මෙවරද ඉතා උත්කර්ෂවත්

අන්දමින් "විවෘත භූමිය සැමට" යන තේමාව යටතේ සැමරීම සිදුකළ අතර ඊට සමගාමී නාගරික ජනාවාස ප්‍රජාව නියෝජනය කරන ළමා හා තරුණ,තරුණියන් කේන්ද්‍ර කොටගෙන වැඩසටහන් විශාල ප්‍රමාණයන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

එසේම 2015 වර්ෂය ආරම්භයේ නව රජය බලයට පත් වීමත් සමඟ රජයේ සංකල්පයකට අනුව සියලුම අංශ ආවරණය වන පරිදි හා මුළු දිවයිනටම බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට යෙදුන දින 100 වැඩසටහන යටතේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් නාගරික ජනාවාසවල ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම අරමුණු කර ගෙන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අතර සභාධිපත්‍ය දේපල නඩත්තුව, කළමනාකරණ හා නිවාසකරණ යන වැඩසටහන් යටතේ කොළඹ, මොරටුව හා අනුරාධපුර යන මහ නගර බල ප්‍රදේශ හා හලාවත, තලවාකැලේ ලිඳුල යන නගර සභා බල ප්‍රදේශ ආවරණය වන පරිදි නාගරික ජනාවාස පැතිකඩ නිර්මාණය කිරීම, සෑම ජනාවාසයකටම ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම සිදුකරන ලදි.

එමෙන්ම ප්‍රජා ක්‍රියාකාරී සැළසුම් වැඩමුළු සෑම ජනාවාසයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත තෝරාගත් ජනාවාස 20 ක ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම හා හඳුනාගත් තවත් ජනාවාස 05 ක් සඳහා ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමට අදාළ මූලික සැළසුම් සකස් කිරීම වැනි කාර්යයන් රාශියක් සිදු කරන ලදි.

ඒ අනුව, 2015 වර්ෂය පුරාවටම අධිකාරියේ දැක්ම වන "තිරසාර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම" යන අරමුණු ළඟා කර ගැනීම ඉලක්ක කොට ගත් වැඩසටහන් විශාල ප්‍රමාණයක් ඉතා සාර්ථක ක්‍රියාත්මක කළ වර්ෂයක් ලෙස දැක්විය හැක.

**සභාපති**

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2015.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල පහත පරිදි වේ.

යූ. ජේ. කුරුකුලරත්න
සභාපති

ආර්. එස්. කහවල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඩී. ඒ. පී. අබේසේකර මහතා

අධ්‍යක්ෂ

නිහාල් ප්‍රනාන්දු මහතා

අධ්‍යක්ෂ

එල්. එස් පලංසූරිය මහතා

අධ්‍යක්ෂ

කේ. ඒ. එස්. වල්පොල මිය

අධ්‍යක්ෂ

ඩබ්. එම්. ගුණරත්න මහතා

අධ්‍යක්ෂ

ආචාර්‍ය මහිම් මෙන්ඩිස් මහතා

අධ්‍යක්ෂ

ඊ. එල්. ඩබ්. සමරසිංහ මහතා

අධ්‍යක්ෂ

ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා

අධ්‍යක්ෂ

ඩී. ඒ. ගාමිණී මහතා

අධ්‍යක්ෂ

ඒ. සන්තියාගෝ මහතා
අධ්‍යක්ෂ

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන හා කළමනාකරණ කමිටුව 2015 වර්ෂය තුළදී රැස්වීම 03 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන හා කළමනාකරණ කමිටුවේ සමාජිකයින් ලෙස කටයුතු කරති.

ඩී. ඒ. පී. අබේසේකර මහතා- සභාපති
ආචාර්ය මහිම් මෙන්ඩිස් මහතා
ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසවල පදිංචි ජනතාවට නිවාස විසඳුම් සපයා දෙන අතර නාගරික ප්‍රදේශවල පිහිටා ඇති, ජීවත්වීමට සුදුසු තත්වයේ නැති නිවාස සමූහ උසස් තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කරයි. ඒ හා සමගම නාගරික ජනාවාසවල ජීවත් වෙන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම පිණිස මානව සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කර ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 12 වැනි සහ 13.6 වැනි වගන්තිය ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු  නිසි පරිදි ගිණුම්ගත කර ගිණුම් පොත් පවත්වාගෙන යාම සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

ඒ අනුව. නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වලදී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, සෑම අවස්ථාකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමත් සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩල වසින් සළකා බලා ඇත.

අධිකාරිය සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ එහි වාර්තාවන්හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන, අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලන වලින් සමන්විත ඵලදායි සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

**අධ්‍යක්ෂ ජනරාල්**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

## විගණන කමිටු වාර්තාව

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන් නිවැරදි, යෝග්‍ය සහ කාලීන වු තොරතුරු සපයාදීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණ කිරීම සඳහාත් සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත වේ. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ඩී. ඒ. පී. අබේසේකර මහතා 2015 වර්ෂයේ කමිටු සභාපති ලෙස කටයුතු කළේය. අචාර්ය මහීම් මෙන්ඩිස් සහ ඒ. කේ. පී. විජිත් චන්දිම යන මහත්වරුන් කමිටු සමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරි සහ රේබීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන කළමනාකරණ කමිටු රැස්වීමවලට සහභාගී වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අනෙකුත් නිලධාරීන් ගණනාවක් රැස්වීම්වලට සහභාගී විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද, 2015 වර්ෂය සඳහා වු අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සළකා බලා අනුමත කරන ලදි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 03 ක් පවත්වා ඇත. විගණන වාර්තා විගණන විමසුම් වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර සහ බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසි කලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත් වැඩිදියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳ කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ගනු ලැබූ තීරණවලට අදාළ පසු විපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදි. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

සාමාජිකයන් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබා දුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද මම අවංකවම ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,
විගණන හා කළමනාකරණ කමිටු ලේකම්,

අධ්‍යක්ෂ ජනරාල්

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

# ක්‍රියාත්මක වැඩසටහන් - 2015

2015 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් ආකාරයට සංවර්ධන වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර ඇත.

1. භෞතික සංවර්ධන වැඩසටහන
   1.1 නාගරික අඩු පහසුකම් ජනාවාසවල ජනතාව සඳහා ප්‍රතිනිවාසකරණ වැඩසටහන
2. නාගරික ප්‍රදේශවල පිහිටි තාවකාලික සහ අර්ධ ස්ථිර නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත් කිරීමේ "ජනසෙවණ දිරිය" නාගරික නිවාස වැඩසටහන

3. "ජනසෙවණ ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන

# භෞතික සංවර්ධන වැඩසටහන

<u>අඟුලාන ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘති</u>





සුනාමි උවදුරින් හා මුහුදු ඛාදනයෙන් අවතැන් වූ ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීම සඳහා රු.මි.1,255.578ක ව්‍යාපෘති පිරිවැයක් සහිතව නිවාස ඒකක 288කින් සමන්විතව ඉදිවූ මෙම නිවාස ව්‍යාපෘතිය 2014 නොවැම්බර් 18 දින ජනතා අයිතියට පත් කරන ලදි. 2015.12.31දිනට ප්‍රතිලාභීන් 223දෙනෙකු සමඟ ගිවිසුම් අත්සන් කරන ලදි.

මහල් නිවාස ජීවන රටාව පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම ඇතුළුව මානව සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක අනෙකුත් වැඩසටහන් ද ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ.මෙම මහල් නිවාස ව්‍යාපෘතිය අඟුලාන වෙරළ තීරය නිදහස් කර ගැනීම සඳහා දායක වී ඇත.

**හලාවත නිවාසකරණ ව්‍යාපෘති**





හලාවත නගර මධ්‍යයේ අඩු පහසුකම් යටතේ ජීවත් වූ හලාවත නගර සභා කම්කරු ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීම හා එම ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් හලාවත නිවාසකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. එය තනි නිවාස ඒකක 57කින් සමන්විත රු. මිලි 60.54 මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව, 2014 දෙසැම්බර් මස ඉදිකිරීම් අවසන් කොට ජනතා අයිතියට පත් කරන ලදි. 2015  යටිතල පහසුකම් සංවර්ධනය එනම්, විදුලිය ලබා දීම, නිරන්තර ගං වතුර තර්ජනයට ලක් වන ව්‍යාපෘති භූමිය සඳහා විධිමත් කාණු පද්ධතියක් සකස් කිරීම සඳහා සැලසුම් කරන ලදි.

**ලුනාව නිවාස ව්‍යාපෘතිය**





අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීමේ අරමුණින් මොරටුව ලුනාව ග්‍රාම නිලධාරි වසමෙහි මහල් 12 කින් (G+11) නිවාස ඒකක 356කින් සමන්විතව රු. මි. 1,369.316 ක මුළු මූල්‍ය ඇස්තමේන්තුවක් සහිතව ලුනාව නිවාස ව්‍යාපෘතිය ඉදිකෙරේ. 2015 දෙසැම්බර්  31 දිනට 62% ක සමුච්චිත භෞතික ප්‍රගතියක් හා රු. මිලි 840.375 සමුච්චිත මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත. 2016 වසරේ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා සැලසුම් කර ඇත.

## තලවකැලේ ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා උඩලැයිම ජනාවාසය හා පැරණි වෙළඳපොළ අසල ඉඩමෙහි වූ ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාව තෝරා ගෙන ඇත. තලවකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ "හෝලිරූඩ්" වත්ත ඉඩමෙහි සංශෝධිත මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි 78.40 සහිතව නිවාස ඒකක 54 කින් තලවකැලේ-ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය සැලසුම් කරන ලදි. 2015 දෙසැම්බර් 31 දිනට සමස්ත සමුච්චිත භෞතික ප්‍රගතිය 80% ක් විය. (මුළු ඉදිකිරීම් පිරිවැය මත භෞතික ප්‍රගතිය 90% ක් විය.) සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු. මිලි 77.21ක් වේ.

## ජනසෙවණ දිරිය නාගරික නිවාස වැඩසටහන - අදියර II

2014 අයවැය ප්‍රතිපාදන රු. මිලි 38.00 මත 2014 ඔක්තෝම්බර් මස නිවාස ණය හඳුනා ගැනීමේ සමීක්ෂණය සමඟ ''ජනසෙවණ'' දිරිය නාගරික නිවාස වැඩසටහන - අදියර II ආරම්භ කරන ලදි. ප්‍රතිලාභීන් 180 දෙනෙකුට අඩු පොලී (පරිපාලන හා අනෙකුත් පිරිවැය ආවරණය සඳහා 6% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ උපරිම ණය මුදල රු. 200,000 කි. උපරිම ණය කාල සීමාව වසර 10කි.) 2015.12.31 දිනට 90% ප්‍රගතියක් වාර්තා කරන ලදි.

ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් අත්සන් කිරීම

**<u>ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද දින 100 වැඩසටහනේ ව්‍යාපෘති හා වැඩසටහන්හි ප්‍රගතිය</u>**

දින 100 වැඩසටහනට සමගාමීව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් නාගරික ජනාවාස සංවර්ධනය, සහාධිපත්‍ය දේපල නඩත්තුව සහ කළමනාකරණය හා ප්‍රතිනිවාසකරණය යන වැඩසටහන් යටතේ කොළඹ, මොරටුව හා අනුරාධපුරය යන මහ නගර සභා බල ප්‍රදේශ හා හලාවත, තලවකැලේ-ලිඳුල යන  නගර සභා බල ප්‍රදේශ ආවරණය කරමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්/ව්‍යාපෘති පහත දක්වා ඇත.

**<u>නාගරිකජනාවාසසංවර්ධනවැඩසටහන</u>**

දින 100 වැඩසටහනට සමගාමීව කොළඹ නගරයේ හඳුනාගනු ලැබූ අඩු පහසුකම් නාගරික ජනාවාස 59 ක සිදුකරන ලද සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

- ජනාවාස 59 සඳහාම නාගරික ජනාවාස පැතිකඩ නිර්මාණය කිරීම
- සෑම ජනාවාසයකටම ප්‍රජා මූල සංවිධානයක් බැගින් වන සේ  ප්‍රජා මූල සංවිධාන 59ක් පිහිටුවීම
- ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් වැඩමුළු 59ක් පැවැත්වීම
- ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන 20ක් පිහිටුවීම හා සැලසුම් කළ ඉතිරි ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන  05ක් පිහිටුවීම සඳහා මූලික කටයුතු අවසන් කිරීම
- මූලික අපරව්‍යුහ පහසුකම්/යටිතල පහසුකම් සංවර්ධනය

සහසපුර නිවාස ව්‍යාපෘතිය, සිංහපුර මහල් නිවාස ව්‍යාපෘතිය (අදියර II), අඟුලාන ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය,  හලාවත නිවාසකරණ ව්‍යාපෘතිය, තලවකැලේ ලිඳුල නිවාසකරණ ව්‍යාපෘතිය - අදියර I හා අනුරාධපුර තුරුඉතුරුගම  හරිත නිවාස ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන්වල  ද දින 100 වැඩසටහනට සමගාමීව සිදු කරන ලද වැඩසටහන් කිහිපයක් පහත සඳහන් කර ඇත.

**<u>සිංහපුර මහල් නිවාස ව්‍යාපෘතිය (අදියර II)</u>**





- සමාජ සජීවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- සහාධිපත්‍ය සැලැස්ම සැකසීම.

**අනුරාධපුර තුරුඉතුරුගම හරිත නිවාස ව්‍යාපෘතිය**




- අනුරාධපුර පූජා භූමි කැණීම් කටයුතු සඳහා, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිලාභීන් අනවසරව පදිංචිව සිටි ඉඩම් නිදහස් කර දීම.
- සමාජ සජීවීකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

**<u>අඟුලාන ප්‍රතිනිවාසකරණ ව්‍යාපෘතිය</u>**

- සහාධිපත්‍ය සැලැස්ම සැකසීම සඳහා මූලික පියවර ගැනීම හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වෙරළ තීරය නිදහස් කර දීම සඳහා මොරටුව ප්‍රාදේශීය ලේකම් හා සම්බන්ධීකරණය හා අවශ්‍ය මූලික පියවර ගැනීම.

## ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතින් පැවරුණ කාර්ය භාරයක් ලෙස ඌණ පහසුකම් නාගරික ජනාවාසයන් හි ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා එම ප්‍රජාව බල ගැන්වීම මෙන්ම එම ප්‍රජාවගේ දරු දැරියන්ගේ හා තරුණ තරුණියන්ගේ දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම උදෙසා මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම අධිකාරියට පවරා ඇත.

එම කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 සිට අඛණ්ඩව පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ ක්‍රියාත්මක කෙරේ.

- නව ජනාවාස වෙත ප්‍රවේශවීම, "ස්වශක්ති "මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා ගෘහ මූලික සමීක්ෂණ කටයුතු.
- "ස්වශක්ති " ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම.
- ප්‍රජා සමිති පිහිටුවමින් හා බලගන්වමින් ප්‍රජා ක්‍රියාකාරි වැඩමුළු පැවැත්වීම (දින 100 වැඩසටහන යටතේ)
- අඩු පහසුකම් ජනාවාස කාන්තාවන් සවිබල ගැන්වීම.
- යෞවන යෞවනියන් සවිබල ගැන්වීමේ වැඩසටහන.
- ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන්.
- ප්‍රජා වෛද්‍ය සායනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාව සමග ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
- ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම.
- සංස්කෘතික වැඩසටහන්
- ප්‍රජා සහභාගීත්ව භෞතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2015 වර්ෂය තුළද මේ යටතේ මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

01. "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා ගෘහ මූලික සමීක්ෂණ කටයුතු

### 1.1 කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ නව ජනාවාසයන්හි සමාජ, ආර්ථික කටයුතු සිදු කිරීම.

"ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන පිළිබඳ පවුල් දැනුවත් කිරීම හා "ස්වශක්ති" පවුල් ලියාපදිංචිය හා තොරතුරු ලබා ගැනීම නව ජනාවාසයන් හි තවදුරටත් 2015 වර්ෂය තුළ දී සිදු කර ඇත. එහි දී ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුම්වත් කිරීම සිදු කරන ලදි.

ඒ අනුව 2015 වර්ෂයේ කොළඹ නාගරික කලාප 04 ම නියෝජනය වන ලෙස කොළඹ නාගරිකය තුළ ජනාවාස 29 ක පවුල් 3531 ක් මෙම වැඩසටහන පිළිබඳව දැනුම්වත් කිරීම හා ගෘහ මූලික සමීක්ෂණ කටයුතු සිදු කරන ලදි.

කොළඹ නාගරික කලාපයෙන් බැහැර ත්‍රිකුණාමලය සමුද්‍රගම ධීවර නිවාස, හම්බන්තොට - සංහිඳගම, සෙත්සඳගම, අවිස්සාවේල්ල - ප්‍රගතිපුර, සීතාඇල්ල ආශ්‍රිත පවුල් 660 කට අධික ප්‍රමාණයකගේ සමාජ, ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කරන ලදි.





"ස්වශක්ති"මානව සංවර්ධන වැඩසටහන පිළිබඳ පවුල් දැනවත් කිරීම හා ස්වහක්ති පවුල් ලියාපදිංචිය හා තොරතුරු ලබා ගැනීම නව ජනාවාසයන් හි තව දුරටත් 2015 වර්ෂය තුළදී සිදු කළ අතර, එහිදී ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු හා ක්‍රියාකාරකම් පිළිබඳව අවිස්සාවේල්ල ප්‍රගතිපුර ජනාවාස ප්‍රජා දැනුම්වත් කිරීම සිදු කරන ලදි.





## 1.2 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් සමීක්ෂණ කටයුතු සිදු කිරීම

“ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස දැනුම්වත් කිරීම හා පවුල් සමීක්ෂණ සිදු කරන ලදි.





## 1.3 හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් සමීක්ෂණ කටයුතු සිදු කිරීම





## 2.0 ''ස්වශක්ති'' ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම.

ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන ජනාවාස වෙත ප්‍රවේශ වී ශක්තිමත් ප්‍රජා මූල සංවිධාන මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කරගැනීම සහ ප්‍රජා මූල සංවිධාන අක්‍රීය ජනාවාසයන්හි ස්වශක්ති ප්‍රජා සංවර්ධන සමිති ගොඩනැගීම මඟින් ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් ජනාවාස තුළ ස්ථාපිත කිරීම සිදු කෙරේ.

## 2.1 තලවකැලේ - ලිඳුල නිවාස ව්‍යාපෘතිය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් මත ''සැමට සෙවණ'' නිවාස ව්‍යාපෘතිය යටතේ කඩිනමින් නිවාස ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත් කිරීමේ ක්‍රියාදාමයක් මේ වන විට දීප ව්‍යාප්ත මට්ටමින් සිදුවෙමින් පවතී.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද තලවකැලේ - ලිඳුල නිවාස ව්‍යාපෘතිය ද උඩලැයිම සහ පැරණි වෙළෙඳපොළ යන ජනාවාසයන්හි ප්‍රතිලාභීන් සඳහා කඩිනමින් ලබාදීමේ අරමුණ ඇතිව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මූලිකත්වයෙන් සහ අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රජා රැස්වීමක් හා නගර සභාවේ නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්වූ අතර, පසුව අප කාර්ය මණ්ඩලය උඩලැයිම සහ පැරණි වෙළෙඳපොළ ජනාවාසයන්හි ක්ෂේත්‍ර නිරීක්ෂණයක නිරත වනු ලැබීය.




සභාපතිතුමිය ලිඳුල නිවාස ව්‍යාපෘතිය නිරීක්ෂණයට සහභාගි වූ අවස්ථාව




අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මූලිකත්වයෙන් සහ අංශ ප්‍රධානීගේ සහභාගීත්වයෙන් යුතුව නගර සභාවේ නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්වූ අවස්ථාව

## 2.2 අනුරාධපුර තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය - ප්‍රජා රැස්වීම

අනුරාධපුර - තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ 2015 වර්ෂයට අදාළව ප්‍රජා සමිතිය යාවත්කාලීන කිරීම මෙහි දී සිදුවිය. මේ සඳහා රාජ්‍ය ආයතනයන් හි නිලධාරීන් සහභාගි වී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වන සේවාවන් සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. තවද ගෙවතු සංවර්ධනය සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදි.





## 2.3 ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රජා සමිති පිහිටුවීම





## 2.4. හලාවත - නරියගොඩැල්ල නිවාස ව්‍යාපෘතිය - ප්‍රජා රැස්වීම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි අක්කර 5 රූඩ් 2 පර්චස් 4 ක නරියගොඩැල්ල නැමති ඉඩමෙහි භුක්තිය ලබා දී එම ඉඩම පුරන්වූ කුඹුරු යායක් වූ අතර, නිවාස ඉදිකිරීමට සම්බන්ධ කරගත් ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම පිටතින් පස් ගෙනවින් නිවාස ඉදිකිරීම් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමට සැලසුම් කළ මුල් අවස්ථාවේදීම හලාවත නගර සභාවේ මැදිහත් වීම හා හඳුනාගත් ප්‍රතිලාභීන් සම්බන්ධ කර ගනිමින් ප්‍රජා සහභාගීත්වය මත මෙම නිවාස ඉදිකිරීම ආරම්භ කරන ලදි.

මෙම ව්‍යාපෘතියට අදාළව ඉදිකළ නිවාස 57 ක් ඉදිකළ අතර, මෙම නිවාසවල පදිංචි දරුපවුල් දශක කිහිපයක් තිස්සේ හලාවත නගරය තුළ ඉතා සංකීර්ණ අයහපත් පරිසරයක අඩු පහසුකම් සහිත යෝග්‍ය නොවන

නිවාසයන්හි පදිංචි වී සිටි අතර, වර්තමානයේ ඔවුන් ඔවුනට හිමි බිම් කැබැල්ලක විධිමත්ව ඉදිකරන ලද නිවසක පදිංචි කර වීමට මෙම වැඩසටහන තුළින් හැකියාව ලැබී ඇත.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මෙම දරුපවුල් සම්බන්ධ කර ගනිමින් ඔවුනට බලපාන ආර්ථික හා සමාජීය ගැටලු විසඳීමේ අරමුණින් මානව සංවර්ධන වැඩසටහන එම දරුපවුල්වල සහභාගීත්වය ඇතිව ක්‍රියාවට නංවමින් ඇත.





## 2.5 අවිස්සාවේල්ල ප්‍රගතිපුර ප්‍රජා රැස්වීම

අවිස්සාවේල්ල ප්‍රගතිපුර ජනාවාසයේ 2015 වර්ෂයට අදාළව ප්‍රජා සමිතිය යාවත්කාලීන කිරීම මෙහිදී සිදුවිය. මේ සඳහා සමාජ සජීවීකරණ අංශයේ නිලධාරීන් සම්බන්ධවී ''ස්වශක්ති'' මානව සංවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.





## 2.6 "සැමට සෙවණ"ආදර්ශ ගම්මාන වැඩසටහන

### 2.6.1 හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රජා සමිතිය පිහිටුවීම - ''සංහිඳගම'' ජනාවාසය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් මත **''සැමට සෙවණ''** නිවාස ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට නයිට් බසාර් ඉඩමෙහි තෝරාගත් නිවාස ප්‍රතිලාභීන් දෙනෙකු සඳහා නිවාස 30 ක් සඳහා මුල්ගල තැබීම සිදු විය. වර්තමානයේ සංහිඳගම යන නාමාවලියෙන් යුත් ව්‍යාපෘති භූමියෙහි නාගරික

ජනාවාස සංවර්ධන අධිකාරියේ මැදිහත්වීම මත හා සමාජ සජීවීකරණ අංශයේ පූර්ණ මහපෙන්වීම මත මෙම ක්‍රියාදාමය ඉතා යුහුසුළුව සිදුවෙමින් පවතී .

ස්ථිර නිවාස නොමැති අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් ක්‍රියාත්මක කරන මෙම නිවාස ව්‍යාපෘතිය විශේෂයෙන් ඔවුන්ගේම ශ්‍රම දායකත්වය සහ සහභාගීත්වය යටතේ සිදුකිරීමට සුවිශේෂී මහපෙන්වීමක් මෙන්ම ඔවුන් කුළුගැන්වීමක් අප ආයතනයේ සමාජ සජීවීකරණ අංශය හරහා සිදු කරයි. විශේෂයෙන් ව්‍යාපෘතිය ආරම්භයේදීම ප්‍රජා සංවර්ධන සමිති ස්ථාපිත කර ප්‍රජාවගේ සංවිධාන ශක්තිය හා සුහදතාවය වර්ධනය කිරීම, ප්‍රජාවගේ ශක්තීන් ඔවුනට හඳුන්වා දීම, අවම මූල්‍ය දායකත්වය හා උපරිම ශ්‍රම දායකත්වයකින් නිවාස ඉදිකිරීමට ප්‍රජාව පෙළඹවීම මේ වන විට සමාජ සජීවීකරණ අංශය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ.





### 2.6.2 හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රජා සමිතිය පිහිටුවීම - "සෙත්සඳගම" ජනාවාසය

ඒ අනුව, "සැමට සෙවණ" නිවාස ව්‍යාපෘතිය යටතේ තෝරා ගන්නා ලද තවත් එක් ව්‍යාපෘති යෝජනාවක් ලෙස ජූල්ගමුව - පල්ලෙමලල ප්‍රදේශයේ ආරම්භ කළ අතර, එය "සෙත්සඳගම" නිවාස ව්‍යාපෘතිය ලෙස නම් කර ඇත. ප්‍රතිලාභීන් 25 දෙනෙකුගෙන් සමන්විත මෙම "සෙත්සඳගම" නිවාස ව්‍යාපෘතිය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සියලු අංශයන්ගේ මැදිහත්වීමෙන් මේ වන විට ආරම්භ වී ක්‍රියාත්මක වෙමින් පවතී.





## 03. ප්‍රජා සමිති පිහිටුවමින් හා බලගන්වමින් ප්‍රජා ක්‍රියාකාරි වැඩමුළු පැවැත්වීම. (දින 100 වැඩසටහන යටතේ)

දින 100 වැඩසටහන යටතේ අඩු පහසුකම් ජනාවාසයන් 70 ක් සම්බන්ධ කර ගනිමින් ප්‍රජාවන්ට තමන් මුහුණපාන ගැටලු හා අවශ්‍යතා හඳුනා ගැනීමට සහාය වීමත්, එම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම්වත් භාවයක් ලබාදීම ප්‍රජා ක්‍රියාකාරි වැඩමුළු පැවැත්වීම මගින් අපේක්ෂා කරන ලදි.

ඒ අනුව කලාප 04 ආවරණය වන පරිදි ප්‍රජා ක්‍රියාකාරි වැඩමුළු 63 ක් සාකච්ඡා මට්ටමින් සකස් කරන ලද ප්‍රජා මූලික සැලැස්ම අදාළ ආයතනවල සහයෝගයෙන් හා සම්පත් දායකත්වයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මග පෙන්වීම ද මෙහිදී ප්‍රජාවන්ට අවබෝධ කර දෙන ලදි.




"දිරියට දිරියක් ස්වයං රැකියා අත්වැල"

## 4.0 අඩු පහසුකම් ජනාවාස කාන්තාවන් සවිබලගැන්වීම

4.1 නාගරික අඩු ආදායම් පවුල් සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන යටතේ අධිවේගී මහන මැෂින් ලබාදීම.

අප අධිකාරිය මගින් ක්‍රියාත්මක ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන යටතේ නාගරික දරු පවුල්වල ආර්ථික ප්‍රවර්ධනය පසුගිය වර්ෂ කිහිපය පුරා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එහිදී තම ස්වයං රැකියාව ලෙස ඇඳුම් මැසීම හා ඒ ආශ්‍රිත වෘත්තින්හි යෙදෙන 87 කු සඳහා අධිවේගී මහන මැෂින් ප්‍රදානය කිරීම සිදු විය.

එම ප්‍රතිලාභීන් වෙත මැෂිමක් ලබාදීමේ දී වැය කළ මුදල වාරික 37 කින් පොලී මුදලක් රහිතව එම මුදල සමාන වාරික ලෙස අය කර ගැනීමේ ක්‍රියාවලියක් මැෂිම ලබාදීමේ දිනයේ සිට මාස 03ක් ඉක්ම ගිය පසු අදාළ අය කිරීම් හා එය නිවැරදිව උපයෝගි කර ගැනීම පිළිබඳ පසු ඇගයීම් ක්‍රියාවලියක් සිදු කරමින් පවතී.





## 4.2 අඩු ආදායම් කාන්තාවන් සඳහා ස්වයං රැකියාවට අත්වැලක්....

කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ ජීවත්වන කාන්තාවන්ගේ දක්ෂතා හා හැකියාවන් අගය කරමින් එම හැකියාවන්ට අත්වැලක් සැපයීම සහ සම්පත් ආයතන, නිලධාරීන් සම්බන්ධීකරණය, ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමයේ මෙහෙයවීමෙන් සිදු කරන ලදි.

ස්වයං හැකියාවෙන් රැකියාවකට මග පෙන්වා පවුලේ ආර්ථික තත්ත්වයට දායකවන කාන්තාවන් නාගරික ක්ෂේත්‍රය තුළ නිර්මාණය කිරීම හා කාන්තාවක් ලෙස නැගී සිටීමට අවශ්‍ය මග පෙන්වීම මෙම වැඩසටහනෙන් සිදුවිය.





"නිපුණත්වය ලැබගන්න - ජීවිතය ජයගන්න"

## 5.0 යෞවන යෞවනියන් සවිබල ගැන්වීමේ වැඩසටහන

## 5.1 හැකියාවට අත්වැලක් සපයන වෘත්තීය පුහුණු පාඨමාලා වැඩසටහන

කොළඹ නාගරික අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසයන්හි තරුණ තරුණියන් තම පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු තම වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීමේ ප්‍රවණතාවය අඩු මට්ටමක පවතින අතර, බොහෝ දුරට නුපුහුණු වෘත්තීන් තුළ නියැලීමේ ප්‍රවණතාවයක් දැකිය හැකිය.

ඒ අනුව එම තරුණ තරුණියන් දැනුවත් කර තම හැකියාවන්ට ගැලපෙන පරිදි වෘත්තීමය පාඨමාලා හැදෑරීමට අවශ්‍ය මග පෙන්වීම අප අධිකාරිය මගින් සිදු කරනු ලැබූ අතර, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමග සම්බන්ධකර ගනිමින් මාලිගාවත්ත ප්‍රදීපා ශාලාවේදී සමාරම්භක උත්සවය පවත්වන ලදි. එදිනම තරුණ තරුණියනේග් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා 112 දෙනෙකු සඳහා ඔවුන්ගේ කුසලතාවයන් අනුව විවිධ පාඨමාලාවන් සඳහා තෝරා ගන්නා ලදි.

මේ සඳහා ජෝන් කීල්ස් ආයතතනය, හෙල්ත් ගාර්ඩ් ආයතනය, ජාතික තරුණ සේවා සභාව ආදි ආයතනයන් සඳහා තරුණ තරුණියන් තෝරා ගන්නා ලදි.






## 5.2 මෝටර් රථ හා ත්‍රීරෝද රථ කාර්මික පුහුණු පාඨමාලාව සඳහා තරුණයන් යොමු කිරීම

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන යටතේ නාගරික ඌන පහසුකම් සහිත ජනාවාසවල වෙසෙන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා විවිධ වූ මානව සංවර්ධන වැඩසටහන් මෙන්ම භෞතික සංවර්ධන වැඩසටහන් රැසක් ඉතා සාර්ථක අයුරින් දියත්කරමින් පවතී. තරුණ ප්‍රජාවගේ ඉල්ලීම පරිදි මෝටර් රථ හා ත්‍රී රෝද රථ කාර්මික පුහුණු පාඨමාලාවක් නාගරික කලාප 04 ආවරණය කරගනිමින් පැවැත්විය. මෙම වැඩසටහන සඳහා සම්පත්දායක ආයතනය වශයෙන් ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම මූලිකත්වය ගෙන කටයුතු කරනු ලැබීය.





## 5.3 තරුණ සමිති පිහිටුවීම

සමාජ සජීවීකරණ අංශයේ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් ත්‍රිකුණාමලය - සමුද්‍රගම ජනාවාසයේ තරුණ ප්‍රජාව ඒකරාශි කරමින් “සාගර” තරුණ සමිතිය පිහිටුවන ලදි.





## 5.4 “ස්වශක්ති”තාරුණ්‍යයට නවමු මඟක් ……

**තරුණ කුසලතා හා නායකත්ව ආකල්ප පුහුණු ප්‍රවර්ධන වැඩසටහන**

තරුණයා තරුණිය යනු අනාගත අභියෝගයේ කොටස්කරුවන්ය. ඔවුහු නිරන්තරයෙන් සමාජය වෙනස් කිරීමේ කාර්යයයෙහි නියැලෙන්නෝය. නවමු චින්තනයේත් අසහාය කාය ශක්තියේත් ස්වභාවික උරුමක්කරුවෝය. ඔවුහු මිනිසා තුළ උපදින බලසම්පන්නම ජීවියෝ ය.

විවිධ ක්‍රීඩාවන් තුළින් ජීවිතය අවබෝධ කර ගැනීමටත්, අභියෝග ජයගැනීමටත්, ක්‍රියාශීලී තරුණ්‍යයක් ගොඩනගා ගැනීමට ඇති හැකියාව පිළිබඳ මෙම වැඩසටහන හරහා හොඳ වැටහීමක් වර්ධනය කරගැනීමට හැකියාව ලැබේ. අද දවසේ බොහෝ තරුණයන් තරුණියන් තමන්ට හිමි සමාජ අවස්ථාවන් මඟහරිමින් කටයුතු කිරීම නිසා ඔවුන් වල්මත් වි ඇති ආකාරයත්" සංවාදයට ලක්කරමින් එදා තාරුණ්‍යයට වඩා අද තාරුණ්‍යය සඳහා සමාජ අවස්ථා බහුල වශයෙන් නිර්මාණය වී ඇත.





## 5.5 ලෝක ජනාවාස දින සැමරුම - 2015

### "ස්වශක්ති"සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය

"ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන කොළඹ නගරයේ ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසවල ජීවත් වන ප්‍රජාවගේ මානව සංවර්ධනය මෙන්ම භෞතික සංවර්ධනය සාරපූර්ණ කරනු වස් ක්‍රියාත්මක වන වැඩසටහනකි.

ලෝක ජනාවාස දිනය සැමරීම නිමිත්තෙන් මෙම යෞවන යෞවනියන්ගේ ක්‍රීඩා කෞෂල්‍යාන් ඔප්නැංවීම අරමුණු කරගනිමින් පැවැත්වෙන "ස්වශක්ති කුසලාන සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය" නාගරික යෞවන යෞවනියන්ට සිය හැකියාවන් වර්ධනය කරගැනීමට මහඟු අවස්ථාවක් වූ බව පැහැදිලිය.

එමෙන් ම 2015 වර්ෂයේදීත් ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් "ස්වශක්ති" සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ මූලික වටයේ තරග අගෝස්තු හා සැප්තැම්බර් මාසයන් තුළදී පැවැත්වූ අතර, පිරිමි කණ්ඩායම් 171 ක් හා කාන්තා කණ්ඩායම් 31 ක් ඇතුළුව කණ්ඩායම් 202 ක් තරගාවලිය සඳහා ලියාපදිංචි විය.

මෙම තරගාවලියේ විනිශ්චය කටයුතු ශ්‍රී ලංකා පාසල් සැහැල්ලු පන්දු ක්‍රිකට් සම්මේලනය විසින් සිදු කරන ලදි.





## 6.0 ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන

**ළමා නායකත්ව, කුසලතා, ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය ක්‍රියාකාරීත්වය ඇති කරනු වස් ළමා සමිති පිහිටුවීම හා යාවත්කාලීන කිරීම**

### 6.1 ළමා සමාජ පිහිටුවීම - කොළඹ දිස්ත්‍රික්කය

නාගරික ජනාවාස දරුවන්ගේ දැනුම, කසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් ස්වශක්ති ළමා සමාජ ගොඩනගමින් ළමා වැඩසටහන් ජනාවාස තුළ ක්‍රියාත්මක කිරීම හා විවිධ ළමා තරඟ, සෞන්දර්ය කුසලතා නංවාලීමේ වැඩසටහන්, ඉතිරි කිරීම් හා ආගමික වැඩසටහන්, ළමා පුස්තකාල ආරම්භ කරමින් ජනාවාස දරුවන්ගේ සෑම අංශයක්ම සංවර්ධනය කිරීම වෙනුවෙන් වැඩටසහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

2015 වර්ෂයේ නාගරික ජනාවාස දරුවන් වෙනුවෙන් ස්ථාපිත කරන ලද ළමා සමාජ ගණන 15 කි. එම ළමා සමාජ හරහා ස්වශක්ති ළමා වැඩසටහන පිළිබඳ නාගරික කලාප 04 ආවරණය වන පරිදි ළමුන් දැනුම්වත් කර ළමුන් 20,000 ක් සම්බන්ධ කර ගන්නා ලදි.





### 6.2 ළමා සමාජ පිහිටුවීම - හම්බන්තොට දිස්ත්‍රික්කය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ "සෑමට සෙවණ" නිවාස ව්‍යාපෘති යටතේ සංහිඳගම හා සෙත්සඳගම නිවාස ව්‍යාපෘතීන්හි දරු දැරියන් ඒකරාශි කර ගනිමින් සමාජ සජීවීකරණ අංශයේ නිලධාරින්ගේ මැදිහත් වීමෙන් ළමා සමිති පිහිටුවන ලදි.





## 6.3 ළමා සමාජ පිහිටුවීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

සමාජ සජීවීකරණ අංශයේ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් ත්‍රිකුණාමලය - සමුද්‍රගම ජනාවාසයේ දරු දැරියන් ඒකරාශි කරමින් "මල් කැකුළු" නමින් ළමා සමිතිය පිහිටුවන ලදි. ඒ සඳහා ළමුන් 30 කට අධික ප්‍රමාණයක් සහභාගි විය. එහිදී ළමුන්ගේ අවධානය දිනා ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදි.





## 6.4 ළමා සමිතිය යාවත්කාලීන කිරීම - අනුරාධපුර දිස්ත්‍රික්කය

අනුරාධපුර - තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ 2015 වර්ෂයට අදාළව ළමා සමිතිය යාවත්කාලීන කිරීම සමාජ සජිවිකරණ අංශයේ නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් මෙහිදී සිදු කරන ලදි. ළමුන් එක්රැස් කරගෙන ඔවුන්ගේ ක්‍රීඩා කුසලතාවයන් ඔප් නැංවීම වෙනුවෙන් හා ඔවුන්ගේ ආකල්පමය වර්ධනය සඳහාත් විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදි.





## 6.5 නව ලොව ජයගන්නට මං පෙත් විවර කරන ඉංග්‍රීසි අධ්‍යාපනික වැඩසටහන

ජගත් බසින් ලොව දිනන්නට නව මං තනන ලෝකයේ එම නවමං ඔස්සේ පිය නඟන්නට සමත් වූ පිරිසක් බිහි කිරීම වස් කොළඹ නාගරිකයෙහි අඩු පහසුකම් සහිත පවුල් වල දරුදැරියන්ගේ අධ්‍යාපනික සංවර්ධනය අරමුණු කොට ගෙන ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රවර්ධනය උදෙසා බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය ඒකාබද්ධ කොට ගනිමින් අවුරුදු 20- 15අතර පිරිස ඉලක්ක ගත කණ්ඩායම බවට පත්කොට ගනිමින් ළමුන් 50 ක කණ්ඩායමක් සඳහා ඔවුන්ගෙන් මුදල් අයකිරීමකින් තොරව සති 10 ක ඉංග්‍රීසි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශය ලබාදෙයි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් නාගරික කලාප 04 ම ආවරණය වන පරිදි ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලදි. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා අධ්‍යාපන සුදුසුකම්, ඉංග්‍රීසි කථන හා ලිඛිත හැකියාව අධීක්ෂණයට ලක් කිරීමෙන් අනතුරුව පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදි.





## 6.6 නාගරික ඌණ පහසුකම් ජනාවාස කේන්ද්‍ර කර ගනිමින් ස්වශක්ති ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

කොළඹ නගරයේ ජීවත් වන ඌන පහසුකම් සහිත ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණ මත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතින් පැවරී ඇති රාජකාරිය තුළ නාගරික ජනාවාස ක්ෂේත්‍රයේ භෞතික සංවර්ධනය මෙන්ම එම දරු පවුල්වල ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා මැදිහත්වීමේ වගකීම ද ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන හරහා ක්‍රියාවට නංවා ඇත.

දැනුම කුසලතා ප්‍රවර්ධනය සඳහා ජනාවාස කිහිපයක් සම්බන්ධ කරගනිමින් පොදු ස්ථානයක සම්පත් මධ්‍යස්ථාන 22 ක් ස්ථාපිත කිරීමට පියවර ගෙන (හඳුනාගත් පොදු මධ්‍යස්ථාන බොහෝ විට විහාරස්ථාන, ප්‍රජා ශාලා) එම ස්ථානයෙහි ප්‍රධානියාගේ එකඟතාවය මත ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ ඇත.

එම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය හා නඩත්තු සඳහා එම ස්ථානයේ ප්‍රධානියා සමඟ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ඇත. එම කමිටුව හරහා එම මධ්‍යස්ථාන සම්බන්ධව සියලු තීන්දු තීරණ ගනු ලබන අතර, එම කමිටු සඳහා අප අධිකාරියේ එම මධ්‍යස්ථාන භාරව කටයුතු කරනු ලබන නිලධාරියා ද සම්බන්ධ කරගනු ලැබේ.





**ලෝක ජනාවාස දින සැමරුම - 2015**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පුරෝගාමීත්වයෙන් ලොවපුරා සැම රටක්ම සැම වර්ෂයකම ඔක්තොම්බර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය සමරයි. මෙවර එම දිනය ඔක්තොම්බර් මස 05 වන දිනට යෙදී තිබුණි.

1985 වසරේ දී "ජැමෙයිකාවේ" පැවති එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසම (හැබිටාට්) සැසි වාරයේදී ශ්‍රී ලංකාව ඉදිරිපත් කරන ලද යෝජනාවක ප්‍රතිඵලයක් අනුව 1986 වසරේ සිට මෙම ජාත්‍යන්තර දිනය සමරනු ලබයි. මෙවර 30 වන වරට සැමරීම් කටයුතු සිදුකරනු ලබයි.

ලෝක ජනාවාස දිනය මෙන්ම මෙම  වර්ෂයේ සිට ජූනි මස 23 දින ප්‍රකාශයට පත් කර ඇති ජාතික නිවාස දිනයද සැමරීමේ ශ්‍රී ලංකාවේ වගකීම දරණුයේ නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය වන අතර,එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන ආයතනයක් වන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පසුගිය වර්ෂවල මෙන් මෙවරද නාගරික ජනාවාස සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක ස්වශක්ති මානව සංවර්ධන වැඩසටසහනට සමගාමීව සුවිශේෂ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. විශේෂයෙන් ළමයින් සහ යෞවන,යෞවනියන් සම්බන්ධ කර ගනිමින් නාට්‍ය තරඟ, ක්‍රිකට් තරඟ, රචනා තරඟ හා චිත්‍ර තරඟය ද මේ අතර ප්‍රධාන තැනක් ගනී.

**2015 වර්ෂයේ තේමාව - "විවෘත භූමිය සැමට" "Public Space for All"**





## 6.7 "ස්වශක්ති"වේදිකාවෙන් කල එළි දුටු ළමා කෙටි නාට්‍ය උළෙල





## 6.8 "ස්වශක්ති" තෙළිතුඩින් සිත්තම් වන ළමා සිතුවම් තරගාවලිය - 2015

හෙට ලොව දිනන්නට වෙර දරණ ළමා ලෝකය සුන්දර වූ කලා සිතුවමක් බඳුය. එවැනි වූ ළමා ලොව තෙළිතුඩින් සිතුවම් වන අයුරු ඉතාමත් චමත්කාරජනකය.මෙවන් වූ කලා නිර්මාණ අපගේ නෙත් අභියස ප්‍රතිරූපණය වූයේ නාගරික ජනාවාස වල ජීවත් වන දරුදැරියන්ගේ දක්ෂතා තුළිනි.

2015 ලෝක ජනාවාස දිනය තේමා කර ගනිමින් මෙවරත් පස්වන වරට නාගරික දරුදැරියන්ගේ කලා මංගල්‍යයන් එළිදැක්වීමෙහිලා මෙන්ම එහි ප්‍රගමනය උදෙසා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සමාජ සජීවීකරණ අංශය මැදිහත්වීමෙන් මෙවරත් උත්කර්ශවත් අන්දමින් ළමා සිතුවම් තරගාවලිය පවත්වන්නට යෙදුනි .

වයස් කාණ්ඩ 18 - 15 ,14 - 10 ,9 - 6යන ඔස්සේ මාතෘකා බාණ්ඩ ගත කරමින් මෙවර ළමා සිතුවම් තරගාවලිය අදියර 03කින් ක්‍රියාත්මක කරන ලදි .ඉන් පළමු අදියරේදී ළමා හැකියාවන් මත චිත්‍ර 9000ක් සිතුවම් කර ගැනීමට සමත් විය.

එදිනම එම චිත්‍ර විනිශ්චය මණ්ඩලයේ විනිශ්චය මත විශේෂ කුසලතා සහිත චිත්‍ර 200ක්ද කුසලතා සහිත චිත්‍ර 400ක් ඇතුළත් චිත්‍ර 600ක් අවසන් චිත්‍ර ප්‍රදර්ශනය සඳහා තෝරා ගන්නා ලදි .











## 6.9 ළමා සිතුවම් තරගාවලියේ සිතුවම් දැක්ම

නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු සම්භාවනීය ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් ලෝක ජනාවාස දින සැමරුම් උත්සවයට සමගාමීව පවත්වනු ලැබූ ළමා සිතුවම් තරගාවලියේ සිතුවම් දැක්ම මාලිගාවත්ත ප්‍රදීපා ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.





### 6.10 "ස්වශක්ති" නිර්මාණශීලි චින්තනයකට පෙරමං තනන පාසල් රචනා තරඟය

ලෝක ජනාවාස දින සැමරුමට සමගාමීව පවත්වනු ලැබූ පාසල් ළමා රචනා තරඟාවලිය ජනාවාස ආශ්‍රිත පාසල් පදනම් කර ගනිමින් පවත්වන ලදි. වයස් කාණ්ඩ 03 ක් යටතේ මෙම රචනා තරගාවලිය පවත්වනු ලැබූ අතර, විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් ජයග්‍රාහකයන් තෝරා ගන්නා ලදි.

## 7.0 නිරෝගීමත් ජන ජීවිතයක් උදෙසා ප්‍රජා වෛද්‍ය සායනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### 7.1 ප්‍රජනන සෞඛ්‍ය සායන වැඩසටහන

ඌණ පහසුකම් සහිත නාගරික කලාපයන්හි වෙසෙන දිළිඳු දරුපවුල්හි වෙසෙන ළමා හා වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් වෛද්‍ය සායනික වැඩසටහන් මාලාවක් පැවැත්විණි. එහිදී විශේෂයෙන් ඌණ පහසුකම් ජනාවාසයන්හි වෙසෙන කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමයේ පූර්ණ අනුග්‍රහය ඇතිව ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් නාගරික කලාප 04 ම අවාරණය වන පරිදි සාර්ථක අයුරින් ක්‍රියාවට නංවනු ලැබිණි.






### 7.2 දන්ත වෛද්‍ය සායන වැඩසටහන

නාගරික කලාප 04 හි වෙසෙන දරු දැරියන්ගේ මුඛ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අරමුණින් මහරගම දන්ත වෛද්‍ය ආයතනයේ පූර්ණ අනුග්‍රහය ඇතිව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් හා සායනික වැඩසටහනක් නවගම්පුර ප්‍රජා ශාලාවේදී පවත්වන ලදි.





## 7.3 ආයුර්වේද වෛද්‍ය සායනය

ප්‍රජා සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ අරමුණින් බස්නාහිර පළාත් ආයුර්වේද කොමසාරිස් කාර්යාලයේ පූර්ණ අනුග්‍රහය ඇතිව බොරැල්ල මැගසින් පාර, ලෙස්ලි රණගල ප්‍රජා ශාලාවේදී දිස්ත්‍රික් වෛද්‍ය කළමනාකාරතුමියගේ ප්‍රධානත්වයෙන් ආයුර්වේද වෛද්‍ය සායනයක් පවත්වන ලදි. මෙහිදී සායනය සඳහා සහභාගිවූ රෝගීන් සඳහා නොමිලේ ඖෂධ ලබාදීම ද සිදු කෙරුණි.

## 7.4 ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන සමග ඒකාබද්ධව කටයුතු කරනු ලබන ස්වේස්පුර ස්වශක්ති මානව සංවර්ධන ප්‍රජා සමිතිය හා ස්වේස්පුර සමාධි යෞවන සමාජය දෙවන වරටත් සංවිධානය කළ ලේ දන් දීමේ වැඩසටහනක් ග්‍රෑන්ඩ්පාස් සිරිමාපුර ප්‍රදීපා ශාලාවේදී පවත්වන ලදි. මේ සඳහා 100 ට අධික ප්රජාවකගේ සහභාගීත්වය ලැබිණි.





## 8.0 ප්‍රජාව සමග ශ්‍රමදාන වැඩසටහන් ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

උතුරු කොළඹ, මැද කොළඹ, බොරැල්ල හා නැගෙනහිර / බටහිර කොළඹ කලාප ආවරණය වන පරිදි ඌණ පහසුකම් සහිත නාගරික ජනාවාසයන්හි වෙසෙන ප්‍රජාවගේ සහභාගීත්වයෙන් කොළඹ මහ නගර සභාව හා ප්‍රජා පොලිස් ඒකකයේ පූර්ණ අනුග්‍රහය ඇතිව, විශේෂයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සමාජ සජීවීකරණ අංශයේ පූර්ණ සම්බන්ධීකරණය ඇතිව පැවැත්වූ මෙම ශ්‍රමදාන වැඩසටහන තුළින් ජනාවාසයන් තුළ පැවති කැළිකසල ඉවත් කිරීම, මළ අපද්‍රව්‍ය ඉවත් කිරීම හා ඩෙංගු මර්දන වැඩසටහන් යටතේ ගෙයින් ගෙට ගොස් ප්‍රජාව දැනුම්වත් කිරීම මෙන්ම මදුරු උවදුර මර්දනය කිරීම සඳහා දුම් ගැසීම හා තෙල් ගැසීම කොළඹ මහ නගර සභාවේ ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ නිලධාරීන්ගේ පූර්ණ සහයෝගයෙන් සිදු කරන ලදි.






## 9.0 ආධ්‍යාත්මික හා මානසික සුවයෙන් පිරිපුන් ප්‍රජාවක් ....

### 9.1 ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන තුළින් සැම විටම උත්සාහ දරන්නේ ආධ්‍යාත්මික හා භෞතික අංශයෙන් පිරිපුන් මිනිසුන් සමූහයක් සමාජයට දායක කිරීමයි.

අඟුලාන මුහුදු ඛාදනයට හසුවන ධීවර ප්‍රජාවගේ අනාගත සුභසිද්ධිය පදනම් කර ගනිමින් අඟුලාන සයුරුපුර මහල් නිවාස සංකීර්ණය ඉදිකර ඔවුන් එහි පදිංචි කරවන ලදි. අනතුරුව ඔවුන්ගේ ආධ්‍යාත්මික හා මානසික සුවය අරමුණු කර ගනිමින් එම නිවාස සංකීර්ණයේ පැවති පිරිත් පිංකම හා දානමය පුණ්‍ය කටයුත්තක් සියලු නිවාස ප්‍රතිලාභීන්ගේ දායකත්වයෙන් පවත්වන ලදි.





## 10.0 සංස්කෘතික වැඩසටහන්

### 10.1 අවුරුදු උත්සවය

මොරටුව අඟුලාන සයුරුපුර මහල් නිවාස සංකීර්ණයේ ප්‍රජාව හා ළමා සමිතිය ඒකාබද්ධව පළමු වරට පවත්වනු ලැබූ අවුරුදු උත්සවය ඉතා සාර්ථක අයුරින් පවත්වන ලදි. මේ සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සමාජ සජීවීකරණ අංශයේ නිලධාරින්ගේ ද මගපෙන්වීම ලබාදෙන ලදි.






## 11.0 ප්‍රජා සහභාගීත්ව භෞතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 11.1 අනුරාධපුර තුරුඉතුරුගම ප්‍රජා ශාලාව ඉදිකිරීම

**302 කටුකැලියාව ගම්මාන සමිතිය සමග ගිවිසුම්ගතව තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියෙහි ස්වශක්ති මානව සංවර්ධන සමිතිය හා එහි සාමාජිකයන්ගේ ශ්‍රම හා ක්‍රියාකාරි ප්‍රජා දායකත්වය ඇතිව ලබාදුන් සැලසුමට අනුව ප්‍රජාවේ ශාලාවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදි. මෙ සදහා දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලදි.**






# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2015/12/31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

1. **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**
2. **ආදායම් හා වියදම් ගිණුම**
3. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
4. **ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
**2015** දෙසැම්බර් **31** දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **වත්කම්** | - | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා බැංකු ශේෂය | 01 | 146,767,755.40 | 81,041,114.83 |
| තොග- (සම්පත් මධ්‍යස්ථාන සඳහා) | 02 | 1,390,086.50 | 11,441,401.85 |
| අත්තිකාරම් | 03 | 331,943.30 | 290,404.00 |
| කාර්ය මණ්ඩල නිවාස ණය | | 21,715,103.42 | |
| ආපදා ණය | | 9,964,875.29 | 7,466,185.85 |
| සුභ සාධක ණය | | 10,000.00 | 10,000.00 |
| රීල් සමාගම | | | 12,100,000.00 |
| ලැබිය යුතු දෑ | 04 | 26,026,594.03 | 16,741,364.25 |
| ලැබිය යුතු 1% සේවාගාස්තු - (නාගරික සංවර්ධන අධිකාරිය) | | 207,331,767.00 | |
| 2016 වර්ෂය සඳහා -ලැබිය යුතු වාරික - විසිරි නිවාස ණය ව්‍යාපෘතිය | | 11,036,104.00 | |
| කොන්ත්‍රාත් අත්තිකාරම් | 05 | 225,297,470.86 | 170,562,116.84 |
| | | **649,871,699.80** | **299,652,587.62** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| නිවාස ණය | 06 | 121,965,368.76 | 124,192,218.57 |
| නොනිමි ව්‍යාපෘති | 07 | 643,847,680.46 | 1,775,592,625.62 |
| දේපල පිරියත හා උපකරණ | 08 | 7,898,473.09 | 12,970,151.34 |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය | | 478,988,658.00 | |
| හලාවත නිවාස ව්‍යාපෘතිය | | 52,177,656.10 | |
| 48 වත්ත නිවාස ව්‍යාපෘතිය (නිවාස 14) | | 34,500,000.00 | 34,500,000.00 |
| තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය (නිවාස 8) | | 6,328,507.81 | 6,328,507.81 |
| | | **1,345,706,344.22** | **1,953,583,503.34** |
| **මුළු වත්කම්** | | **1,995,578,044.02** | **2,253,236,090.95** |
| **වගකීම්** | | | |
| - | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 09 | 23,628,810.53 | 242,944,312.78 |
| කළමනාකරණ සංස්ථා අරමුදල | | 11,105,000.00 | 7,830,000.00 |
| රඳවාගත් මුදල් | 10 | 51,672,834.75 | 44,179,170.33 |
| නිවාස සංවර්ධන අධිකාරිය | 11 | 1,192,275.15 | 2,959,364.16 |
| ඉදිරියට ලද වාරික -විසිරි නිවාස ණය ව්‍යාපෘතිය | | 167,530.00 | |
| ඉදිරියට ලද වාරික -සිංහපුර කුලී නිවාස | | 90,000.00 | |
| අඟුලාන කුලී අත්තිකාරම් | | | 8,250,000.00 |
| | | **87,856,450.43** | **306,162,847.27** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 9,714,817.25 | 5,738,637.50 |

| | | | |
|---|---|---|---|
| | | **9,714,817.25** | **5,738,637.50** |
| **මුළු වගකීම්** | | **97,571,267.68** | **311,901,484.77** |
| **<u>ශුද්ධ වත්කම්</u>** | | **1,898,006,776.34** | **1,941,334,606.19** |
| - | | | |
| **<u>ස්කන්ධය හා සංචිත</u>** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | **12** | 1,627,739,363.69 | 1,878,411,960.70 |
| ආදායම් සංචිත | | 93,094,358.50 | 93,094,358.50 |
| | | **1,720,833,722.19** | 1,971,506,319.20 |
| **සමුච්චිත අරමුදල** | | (30,171,713.01) | (19,887,113.92) |
| වසර සඳහා අතිරික්තය / (ඌනතාවය) | | 207,344,767.16 | (10,284,599.09) |
| | | **177,173,054.15** | **(30,171,713.01)** |
| **මුළු ස්කන්ධය** | | **1,898,006,776.34** | **1,941,334,606.19** |

පිටු අංක 03 - 05 හි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 10 සිට 14 දක්වා දැක්වෙන සටහන් මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ මූලිකාංගයකි. අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව තිබෙන අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

| | | |
|---|---|---|
| .................................. | ........................................ | .................................. |
| අධ්‍යක්ෂ (මුදල්) | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| නා.ජ.සං.අ. | නා.ජ.සං.අ. | නා.ජ.සං.අ. |

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් හා වියදම් ගිණුම**

| | සටහන | 2015 | 2014 |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| නිවාස අමාත්‍යාංශය | | 41,651,140.00 | 49,136,399.70 |
| භාණ්ඩාගාර ප්‍රදාන | | 73,730,000.00 | 67,000,000.00 |
| පොළී අදායම් | **13** | 7,827,568.80 | 8,287,240.82 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | | 3,891,911.75 | |
| 1% සේවා ගාස්තු අදායම් | | 207,331,767.00 | |
| වෙනත් අදායම් | **14** | 1,205,955.00 | 1,677,350.82 |
| **මුළු ආදායම්** | | **335,638,342.55** | **126,100,991.34** |
| **වියදම්** | | | |
| **පරිපාලනවියදම්** | | | |
| වැටුප් | | 50,109,723.94 | 33,652,379.26 |
| අතිකාල දීමනා | | 2,234,551.28 | 2,749,329.60 |
| වෙනත් දීමනා | | 1,039,201.00 | 2,889,803.52 |
| ප්‍රසාද දීමනා | | 1,785,000.00 | 1,335,000.00 |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | | 789,652.00 | 897,460.00 |
| ගමන් වියදම් | | 490,730.81 | 629,771.00 |
| විදේශ ගමන් වියදම් | | | 2,211,339.47 |
| ලිපි ද්‍රව්‍ය | | 1,102,858.58 | 2,310,209.87 |
| ඉන්ධන | | 1,848,772.53 | 2,290,876.10 |
| සුභ සාධන වියදම් | | 733,604.00 | 629,909.00 |
| පුවත්පත් | | 29,740.00 | 35,125.00 |
| මුද්දර ගාස්තු | | 138,925.00 | 80,305.00 |
| බැංකු වියදම් | | 5,550.00 | 15,000.00 |
| දුරකථන වියදම් | | 1,231,267.90 | 1,441,799.26 |
| කාර්යාල කුලී වියදම් | | 10,294,302.32 | 6,914,421.64 |
| අළුත්වැඩියා හා නඩත්තු(කාර්යාලීය උපකරණ) | | 564,053.49 | 471,299.21 |
| වාහන අලුත්වැඩියාව හා නඩත්තුකිරීම් | | 3,590,993.34 | 2,087,204.23 |
| ගොඩනැගිලි අලුත්වැඩියාව හා නඩත්තුකිරීම | | 6,996.00 | 352,476.50 |
| ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ | | 171,453.71 | 3,451,546.86 |
| රක්ෂණ වියදම් | | 430,566.08 | 471,781.70 |
| පිරිසිදු කිරීම් | | 677,626.49 | 376,875.00 |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | | 315,235.68 | 493,850.00 |
| මුද්‍රණ වියදම් | | 96,430.00 | 1,018,633.90 |
| පරිභෝජන අයිතම මිලදී ගැනීම | | 15,670.00 | 38,167.00 |
| ප්‍රචාරණ | | | 244,093.00 |
| වෙනත් වියදම් ද්‍රව්‍ය | | 30,575.00 | 26,924.00 |
| වෙනත් වියදම් සේවා | | 42,506.84 | 135,558.72 |
| විගණන ගාස්තු | | 139,860.00 | 115,320.00 |
| සේ.අ.සා. අරමුදල | | 8,131,190.90 | 8,922,837.38 |
| සේ.භා. අරමුදල | | 1,219,678.62 | 1,337,258.87 |
| ආරක්ෂක වියදම් | | 324,000.00 | 289,000.00 |
| පාරිතෝෂික | | 4,691,429.75 | 1,499,716.87 |

| | | | |
|---|---|---|---|
| විදුලි වියදම් | | 18,470.31 | 136,298.26 |
| ජල බිල්පත් | | 24,404.25 | 181,484.06 |
| සංග්‍රහ වියදම් | | | 8,710.00 |
| වෛද්‍ය වියදම් | | 18,000.00 | 2,500.00 |
| දැයට කිරුළ වැඩසටහන | | | 208,800.00 |
| විසිරි නිවාස ණය එකතු කිරීමේ කොමිස් | | | 143,690.70 |
| ණය එකතු කිරීමේ කොමිස් | | 823,533.73 | |
| බොල් ණය | | 8,816.44 | |
| රීල් සමාගම | | 2,047,958.78 | |
| ප්‍රවාහන වියදම් | | 1,071,155.89 | 5,404,151.55 |
| අඩමාන ණය - විසිරි නිවාස ණය | | 921,937.00 | |
| ක්ෂය | **08** | 2,693,375.25 | 2,389,984.05 |
| | | **99,909,796.91** | **87,890,890.58** |
| **<u>සංවර්ධනවියදම්</u>** | | | |
| සිංහපුර නිවාස ව්‍යාපෘතිය | | | 3,617,773.33 |
| ස්වශක්ති ප්‍රජා සමිති ඉදිකිරීම් | | 94,524.68 | 5,174,563.71 |
| සහස්පුර නිවාස ප්‍රතිසංස්කරණ | | | 343,750.00 |
| ජනාවාස දින සැමරුම් වැඩසටහන | | 6,070,558.24 | 24,074,474.18 |
| උත්සව වියදම් | | | 14,000.00 |
| ස්වශක්ති මානවසංර්ධන | | 8,244,530.85 | 15,261,553.63 |
| හම්බන්තොට සනීපාරක්ෂක ව්‍යාපෘතිය | | 7,275,996.00 | |
| සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම් | | 1,055,381.70 | |
| අඟුලාන ව්‍යාපෘතිය නඩත්තුකිරීම් | | 1,972,786.30 | |
| හම්බන්තොට නිවාස ව්‍යාපෘතිය | | 382,402.76 | |
| සීතාවක නොනිමි ව්‍යාපෘති ශේෂය | | 2,395,289.96 | |
| ත්‍රිකුණාමලය නොනිමි ව්‍යාපෘති ශේෂය | | 747,754.49 | |
| ලුනාව - මිල කමිටු ගාස්තු | | 144,553.50 | |
| අනුරාධපුර නිවාස ව්‍යාපෘතිය | | | 8,585.00 |
| | | **28,383,778.48** | **48,494,699.85** |
| **මුළු වියදම** | | **128,293,575.39** | **136,385,590.43** |
| **කාලච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාවය)** | | **207,344,767.16** | **(10,284,599.09)** |

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
## 2015 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2015 | 2014 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| <u>ලැබීම්</u> | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) | 73,730,000.00 | 67,000,000.00 |
| වෙනත් අදායම් | 420,955.00 | 951,470.00 |
| පොළී අදායම් | 1,714,869.57 | 2,219,950.61 |
| අපදා ණය අයවීම | 2,504,602.09 | 798,580.96 |
| අඟුලාන වාරික | 452,800.00 | |
| කාර්ය මණ්ඩල නිවාස ණය වාරික | 2,317,987.05 | |
| කුලී අදායම් | 712,000.00 | 315,000.00 |
| ටෙන්ඩර් ගාස්තු | | |
| | 81,853,213.71 | 71,285,001.57 |
| <u>ගෙවීම්</u> | | |
| වැටුප් හා වෙනත් දීමනා | 70,460,051.83 | 52,666,392.31 |
| ගමන් වියදම් | 473,224.31 | 2,808,721.97 |
| සේවා | 3,113,622.91 | 4,923,098.65 |
| ගිවිසුම්ගත සේවා | 15,041,958.42 | 19,816,337.97 |
| නඩත්තු වියදම් | 4,591,453.91 | 7,042,858.38 |
| ණය එකතු කිරීමේ කොමිස් | 814,703.73 | |
| මුදල් අත්තිකාරම් | 41,539.30 | 67,839.00 |
| | 94,536,554.41 | 87,325,248.28 |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(12,683,340.70)** | **(16,040,246.71)** |
| **ආයෝජන ක්‍රියාකාරම්** | | |
| <u>ලැබීම්</u> | | |
| නිවාස සංවර්ධන අධිකාරිය -සහස්පුර ප්‍රතිසංස්කරණ | 7,121,750.17 | 31,141,388.49 |
| විසිරි නිවාස ණය වාරික | 8,394,227.06 | 3,833,684.86 |
| ලැබූ අරමුදල් - රීල් | 10,414,448.72 | 1,003,674.00 |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය සඳහා ලැබූ අරමුදල් | | |
| අනුරාධපුර කටුකැලියාව නිවාස ව්‍යාපෘති වාරික | | 246,000.00 |
| ස්වශක්ති ස්වයං රැකියා වාරික | 191,413.86 | 232,710.32 |
| | 26,121,839.81 | 36,457,457.67 |
| <u>ගෙවීම්</u> | | |
| අඟුලාන නිවාස ව්‍යාපෘතිය | 158,920,614.77 | 241,357,521.01 |
| ලුනාව නිවාස ව්‍යාපෘතිය | 193,101,097.71 | 197,901,493.05 |
| තලවකැලේ නිවාස ව්‍යාපෘතිය | 7,133,609.12 | 40,957,707.24 |
| හලාවත නිවාස ව්‍යාපෘතිය | 761,819.88 | 47,510,561.35 |
| සීතාවක නිවාස ව්‍යාපෘතිය | 880,607.46 | 1,514,682.50 |
| හම්බන්තොට ව්‍යාපෘතිය | 7,475,273.76 | |

| | | |
|---|---|---|
| ත්‍රිකුණාමල නිවාසව්‍යාපෘතිය | 9,400.00 | 738,354.49 |
| අනුරාධපුර නිවාස ව්‍යාපෘතිය | - | - |
| සහස්පුර ප්‍රතිසංස්කරණ | 8,888,839.18 | 28,525,774.33 |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම් | 2,295,163.20 | 4,176,057.60 |
| මානව සංවර්ධන වැඩසටහන | 15,387,413.42 | 47,584,974.09 |
| 48 වත්ත | | 4,520,948.75 |
| කාර්ය මණ්ඩල නිවාස ණය | 23,400,000.00 | |
| විසිරි නිවාස ණය | 12,500,000.00 | 21,425,000.00 |
| | 430,753,838.50 | 636,213,074.41 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරම් වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(404,631,998.69)** | **(599,755,616.74)** |
| | | |
| **මුල්‍ය කටයුතු** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධනවියදම්) | 479,766,979.96 | 596,664,061.18 |
| අඟුලාන කළමනාකරණ සංස්ථා අරමුදල | 3,275,000.00 | 6,180,000.00 |
| **මුල්‍ය ක්‍රියාකාරම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **483,041,979.96** | **602,844,061.18** |
| | | |
| මුදල් හා මුදල් හා සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 65,726,640.57 | (12,951,802.27) |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | 81,041,114.83 | 93,992,917.10 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දේ | **146,767,755.40** | **81,041,114.83** |
| | | |

<u>සටහන - මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

**31/12/2015 දින මුදල් පොතේ ශේෂය**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව බත්තරමුල්ල (පුනරාවර්තන) ගිණුම | 2,758,430.41 | |
| ලංකා බැංකුව බත්තරමුල්ල (ප්‍රාග්ධන) ගිණුම | 92,893,228.98 | |
| ලංකා බැංකුව බත්තරමුල්ල (අනුරාධපුර) ගිණුම | 2,152,504.75 | |
| ලංකා බැංකුව බත්තරමුල්ල (නාගරික ජනාවාස ප්‍රවර්ධන වැඩසටහන) | 16,450.39 | |
| ඉතිරි කිරීම් ගිණුම | 37,654,143.53 | |
| ඉතිරි කිරීම් ගිණුම-කළමනාකරණ සංස්ථා අරමුදල | 11,292,997.34 | |
| | **146,767,755.40** | - |

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## 31/12/2015 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

| විස්තරය | සටහන | සමුච්ත අරමුදල | | රාජ්‍ය ප්‍රදානන | | රැඳවූ අරමුදල් | | අදායමට එරෙහිව කපාහැරීම | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 |
| **2015/01/01** ශේෂය | - | (30,171,713.01) | (19,887,113.92) | 1,878,411,960.70 | 1,315,464,107.72 | 93,094,358.50 | 4,605,240.63 | 0.00 | 199,332,113.44 | 1,941,334,606.19 | 1,499,514,347.87 |
| ප්‍රවර්තන වර්ෂය තුල ප්‍රධාන ලැබීම් | | | | 464,706,000.00 | 562,947,852.98 | | | | | 464,706,000.00 | 562,947,852.98 |
| අදායම්සංචිත | | | | | | | 93,094,358.50 | | | | 93,094,358.50 |
| කාලපේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | | 207,344,767.16 | (10,284,599.09) | (688,771,986.58) | | | 1,133,396.87 | | | (481,427,219.42) | (9,151,202.22) |
| වසර තුල ගෙවීම් | | | | (26,606,610.43) | | | | 0.00 | 106,830,733.83 | (26,606,610.43) | 106,830,733.83 |
| **2015/12/31** ශේෂය | - | 177,173,054.15 | (30,171,713.01) | 1,627,739,363.69 | 1,878,411,960.70 | 93,094,358.50 | 98,832,996.00 | | 306,162,847.27 | 1,898,006,776.34 | 2,253,236,090.96 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : එච්යූඩී/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/15/01
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2016 දෙසැම්බර් 09 දින

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2016 දෙසැම්බර් 06 දින නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSA1 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අහිතකර මතය සඳහා පදනම

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු. මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය නිම වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් සපයා නොතිබුණි.

(ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතු නමුත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. මේ අනුව භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව අධිකාරිය පවත්වාගෙන යාමේ අවිනිශ්චිත තත්ත්වයක් පවතී.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන රජයේ ප්‍රදාන සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අහුලාන නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.1,179,062,714 ක් වියදම් කර තිබූ නමුත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත භාණ්ඩාගාර ප්‍රදානයෙන් රු.684,298,437 ක් කපා හැරීම නිසා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ආ) බැංකු ජංගම ගිණුමකට අදාල සෘජු බැර රු.1,199,250 ක් මාස 12 ක් තිස්සේ හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අහුලාන නිවාස ව්‍යාපෘතිය සඳහා එම ව්‍යාපෘතියට යාබද ඉඩම් හෙක්ටයාර් 0.0508 ක් රු.5,020,516 ගෙවා අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණි. මෙම ස්ථාවර වත්කම පිළිබඳ තොරතුරු ජංගම නොවන වත්කම් තුළ ඉඩම් යටතේ වෙනම හෙළිදරව් නොකර ව්‍යාපෘති පිරිවැයට එකතු කර තිබුණි.

(ඈ) අධිකාරියේ පරිපාලිත සමාගමක් වෙතින් අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂයේදී පවරාදී තිබූ මෝටර් වාහන 04 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු.3,891,911 ක් අදාළ ආයතනයේ එකඟතාවයකින් තොරව නිරවුල් නොකර ආදායමට බැර කර තිබුණි.

(ඊ) දේපල සංවර්ධනය කරන්නන්ගේ සේවා ගාස්තු වශයෙන් අධිකාරියට ලැබිය යුතු මුදල් රු.207,331,767 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් රැස් කර ගෙන තිබුණි. මෙම මුදල ඉකුත් වර්ෂවලට අදාළ වුවද අතීතානුයෝගීව ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේදී ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

4

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ස්වශක්ති මධ්‍යස්ථාන 6 කට ලබාදුන් රු.1,675,608 ක් වටිනා පරිගණක හා ලී බඩු උපකරණ භාර දුන් බව සනාථ කිරීමට උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ලබා දී තිබුණු එකතුව රු. 200,091 ක අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විසිරි නිවාස ණය වැඩසටහනෙන් පළමු අදියර යටතේ ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.16,851,730 ක් වූ අතර ඉන් වසර 1 සිට වසර 2 අතර ශේෂය රු.4,453,942 ක් ද අවුරුදු 2 ට වැඩි ශේෂය 7,000,739 ක්ද විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු අඟුලාන නිවාස ණය වාරිකය රු.7,525,619 ක් වුවද ඉන් අයකර ගත් ණය වාරික වටිනාකම රු. 452,800 ක් වූයෙන් අය කර නොගත් ණය වාරිකය, මුළු ණය වාරික වටිනාකමින් සියයට 93ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අධිකාරිය විසින් ප්‍රජා මූල සමිති වෙත ගෙවිය යුතු රු.11,105,000 ක මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

5

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 7 ක් ගතවී තිබුණද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. |
| | 10 වගන්තිය | අධිකාරිය විසින් සභාපතිවරයකුද ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් පත් කළ යුතු වුවත් එලෙස උපදේශක කමිටුවක් පත් කර නොතිබීම හේතුවෙන් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණු වලට අදාළ කාර්යයන් අනුමත කිරීමේදී ඒ සඳහා උපදෙස් ලබාදීමේ ක්‍රම වේදයක් සකස් වී නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ලබා දුන් පසු එම කාර්යය නිම වූ වහාම අදාල ලදුපත් ඉදිරිපත් කර අත්තිකාරම් නිරවුල් කල යුතු වුවද, අවස්ථා 84 කදී ලබාදුන් එකතුව රු.1,098,362 ක අත්තිකාරම් නිරවුල් කිරීමට මාස 01 ත් මාස 05 ත් අතර කාලයක් ගත වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 756 | අධිකාරිය විසින් සම්පත් මධ්‍යස්ථාන වෙත බෙදා හැරීම සඳහා මිලදී ගෙන තිබූ එකතුව රු.1,390,086 ක් වටිනා ලී බඩු , ප්ලාස්ටික් පුටු, මහන මැෂින් හා පරිගණක වර්ෂය අවසාන තොග සමීක්ෂණයට ඇතුළත් කර නොතිබුණි. |
| (ඇ) | 1982 අංක 45 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (සංශෝධන) පනත 20 (ඌ) උප වගන්තිය | අහුලාන නිවාස ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා කළමනාකරණ කමිටු පිහිටු විය යුතු වුවද අදාල කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු නොකර, ඒ සඳහා නිවාසලාභීන්ගෙන් අයකර ගත් රු.11,105,000 ක් අධිකාරියේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. මෙලෙස කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතියේ නඩත්තුවියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට දැරීමට සිදුවූ වියදම රු. 1,972,786 ක් විය. |
| (ඈ) | 2007 පෙබරවාරි 22 දිනැති අංක අමප/07/0140/226/103 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අධිකාරිය පිහිට වූ වහාම රියල් එක්ස්ටේට් එක්ස්චේන්ජ් (පුද්) සමාගම ඇවර කර එම සමාගමේ වත්කම් හා වගකීම් අධිකාරියට පවරා ගත යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සමාගම ඇවර කිරීමට කටයුතු කර නොතිබුණි. |

7

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | 3.4.3 වගන්තිය | සැපයුම් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ඇති විට ඔවුන් ගෙන් මිල කැඳවීම් කල යුතු වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.4,851,464 ක ලී බඩු මිලදී ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් එක් අයෙකුගෙන් හා ලියාපදිංචි වී නොමැති ආයතන 07 කින් මිල ගණන් කැඳවා තිබුණි. |
| (ii) | 5.1.1 වගන්තිය | මිල ගණන් කැඳවීමේදී අයිතම වල පිරිවිතර පැහැදිලිව දැක්විය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබීම හේතුවෙන් මිල ගණන් සංසන්දනය කිරීම අපහසු වී තිබුණි.<br>උදා. මේස වල ලී වර්ගය, පරිගණක මේසයක ප්‍රමාණය |
| (iii) | 5.4.5. වගන්තිය | ආනයන උපකරණ මිලදී ගැනීමේදී ආයතනය නමින් ණයවර ලිපි නිකුත් කිරීම වෙනුවෙන් පමණක් සියයට 30 ක අත්තිකාරමක් සැපයුම් කරුට ගෙවිය හැකි වුවද අධිකාරිය විසින් ලී බඩු ලැබීමට ප්‍රථම සියයට 50 ක අත්තිකාරමක් ලෙස රු.2,420,636 ක් ගෙවා තිබුණු අතර එවැනි අත්තිකාරමක් ගෙවිය යුතු බවට මිලදී ගැනීමේ කොන්ත්‍රාත් වලද අන්තර්ගතව නොතිබුණි. |

8

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සේවකයන්ට රු. මිලියන 23.6 ක නිවාස ණය ලබා දී තිබුණු නමුත් මහා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව විසිරි ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන මේ සඳහා යොදා ගෙන තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.207,344,767 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,284,599 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 217,629,366 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. දේපළ සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු ලෙස පූර්ව වර්ෂ වලදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කර අධිකාරියට ගෙවිය යුතුව පැවති රු.207,331,767 ක සේවා ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කිරීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.57,276,732 ක මූල්‍ය ඌනතාවයක් පැවතියද 2012 සහ 2013 වර්ෂවල පිළිවෙලින් රු.11,619,000 ක හා රු.6,032,874 ක මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. නැවතත් 2014 වර්ෂයේදී රු.10,284,599 ක මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු.207,344,767 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේදී රු.31,567,761 ක්වූ සෘණ අගයක් ගෙන තිබුණද 2012 වර්ෂයේ සිට එය ධන අගයක් ලෙස අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.263,421,617 ක් වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමහ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සේවා ගාස්තු ආදායම සියයට 100 කින් වැඩි වී තිබුණු අතර එය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 62 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමහ සැසඳීමේදී ජංගම අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 87 කින් හා සියයට 875 කින් වර්ධනය වී තිබුණු අතර දේපළ සංවර්ධනය කරන්නන්ගේ සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කර අධිකාරියට ගෙවිය යුතු රු.207,331,767 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගැනීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ධ

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

----------------

තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති වන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් පහසු නිවාස පහසුකම් හා අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාස වල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ අරමුණු වේ.

ඉහත අරමුණු ඉටු කරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී නිවාස ඒකක 4,122 ක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘති 07 ක් ඇතුළත්ව ව්‍යාපෘති 10 ක් සඳහා රු.මිලියන 993 ක් වැය කිරීමට සැලසුම් කර තිබුණද එහි සමස්ත මූල්‍ය කාර්යසාධනය රු. මිලියන 449 ක් හෙවත් සියයට 45 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 190.52 ක් වූ වැඩ සටහන් 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය පවුල් පදිංචි කිරීමේ වැඩ සටහන යටතේ නිවාස ඒකක 96 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 150 ක වැඩ කොටස් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 25 ක් හෙවත් සියයට 16 ක පහල අගයක් විය.

(ඈ) මානව සංවර්ධන වැඩ සටහන යටතේ පවුල් ඒකක 50,000 කට සේවා සැපයීමට රු.මිලියන 23 ක් වැය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ඒකක 4,190 කට පමණක් සේවා සැපයීම සඳහා වෙන් කරන ලද මුදලින් සියයට 99 ක් හෙවත් රු.මිලියන 22.76 ක් වැය කර තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

(ඉ) සංයුක්ත සැලැස්ම තුල ඇතුළත් නොවූ සමාජ සජීවිකරණ වැඩ සටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුල අඩු ආදායම්ලාභී ව්‍යවසායක කාන්තාවන් සඳහා මහන මැෂින් ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 12 ක් වැය කර තිබුණි

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිංහපුර නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 14 ක් වසර 05 ක කාලයක් සඳහා මාසයකට රු.5,000 බැගින් බදු පදනම මත ලබා දී තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව නොකඩවා මාස 03 ක කාලයක් බදු කුලී නොගෙවන්නේ නම් ගිවිසුම අවලංගු කළ යුතු වුවත් මාස 5 සිට මාස 34 ක කාලයක් සඳහා බදු කුලී ගෙවා නොතිබුණු නිවාස 08 ක බදු ගිවිසුම් අවලංගු කර නොතිබුණි.

(ආ) 2014 ජුනි 27 දින පැවති අංක 06/2014 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ස්වශක්ති මධ්‍යස්ථාන 26 ක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ ස්ථාන 12 ක මධ්‍යස්ථාන නොපිහිටුවා ඒ වෙනුවට වෙනත් මධ්‍යස්ථාන 11 ක් පිහිටුවා තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිරිය නිවාස වැඩසටහන යටතේ ණය ලාභීන් 435 ක් වෙනුවෙන් රු. 76,165,000 ක් නිදහස් කර තිබුණි. ණය ලබාදීම් වලට අදාල ණය ලෙජරය යාවත්කාලීන කර නොතිබුණු අතර මුදල් ලැබීමේ ලදුපත් වල පිටපතක්, ඇප කරුවන්ගේ හැඳුනුම්පත් විස්තර ණය ලිපි ගොනු වලට ඇතුළත් කර නොතිබුණි. තවද ග්‍රාම නිළධාරී සහතික කිරීමෙන් තොරව ණය ලබාදීමේ අවස්ථා සහ දිවුරුම් ප්‍රකාශ සම්පූර්ණ කර නොතිබීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම පිළිවෙලින් රු.58,594,359 ක් හා රු.34,500,000 ක් වූ තුරුඉතුරු ගම හා 48 වත්ත නිවාස ව්‍යාපෘති වල නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් සියයට 10 ක කොමිස් මුදල් ලෙස 2015 වර්ෂයේදී රු.823,534 ක මුදලක් ණය එකතු කරන්නන්ට ගෙවා තිබුණද අහුලාන නිවාස ණය සහ දිරිය නිවාස ණය පළමු අදියර වැඩසටහන්හි ණය අයකර ගැනීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 6 ක සහ සියයට 48 ක පහළ අගයක් ගෙන තිබුණි.

11

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

විසිරි නිවාස ණය ලබාදීම සඳහා 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අමාත්‍යාංශයෙන් රු. මිලියන 90 ක් ලැබී තිබූ අතර ඉන් පලමු අදියරේදී රු. මිලියන 46 .23 ක්ද දෙවන අදියරේදී රු. මිලියන 34.60 ක්ද විසිරි ණය ලෙස ලබා දී තිබූ අතර ඉතිරි රු. මිලියන 9.17 ක් වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට නාගරික ප්‍රදේශ වල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විවිධ ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 508 ක් අධිකාරිය වෙත ලබා දී තිබුණු අතර අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත විවිධ ව්‍යාපෘති හරහා අඩු ආදායම්ලාභීන් වෙත ලබා දී තිබූ මූල්‍ය හා භාණ්ඩ ආධාර වටිනාකම් ප්‍රතිලාභීන්ගෙන් නැවත අයකර ගැනීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එලෙස අඩු ආදායම් ලාභීන්ගෙන් අයකර ගෙන ඇති වාරික හා ණය පොළී වටිනාකම රු.23,287,518 ක් විය.

## 4.6 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මහා භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘති සඳහා රු. මිලියන 1,407 ක් ලැබී තිබුණු අතර එම ව්‍යාපෘති සඳහා රු. මිලියන 1,341 ක් පමණක් වියදම් කර තිබුණි. මේ අනුව ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් වලින් රු. මිලියන 66 ක් එම ව්‍යාපෘති සඳහා වියදම් නොකර අධිකාරිය රඳවා ගෙන තිබූ අතර ඉතිරි අරමුදල් මහා භාණ්ඩාගාරයට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.

## 4.7 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ මැයි වන විට ස්වශක්ති මධ්‍යස්ථාන දෙකක් සඳහා රු. 618,115 ක් වටිනා පරිගණක හා උපාංග ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිගණක පංති ආරම්භ නොකිරීම හේතුවෙන් එම පරිගණක ප්‍රයෝජනයට නොගෙන ඌන උපයෝජිත තත්ත්වයක පැවතුණි. එමෙන්ම භාණ්ඩවල සේවා වගකීම් කාලයද අවසන්ව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි අධිකාරිය සතු ජීප් රථයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.540,911 ක් වැය කර තිබුණද අළුත්වැඩියාවෙන් පසු මාස 06 ක් ධාවනයේ නොයොදා ගාල්කර තිබුණි.

(ඇ) හලාවත නිවාස ව්‍යාපෘතියේ ගඩොල් නිෂ්පාදනය වෙනුවෙන් මිලදී ගනු ලැබූ රු. 1,150,000 ක් වටිනා යන්ත්‍ර 06 ක් ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) සිංහපුර නිවාස ක්‍රමයෙහි අංක 70/37/4/1 දරන නිවස 2012 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

**4.8 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

" සීතාවක නිවාස ව්‍යාපෘතිය" ආරම්භ කිරීමේ උත්සවය හා "ජන සෙවණ ස්වශක්ති" ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීමේ සමාරම්භක උත්සව වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,231 ,552 ක මුදලක් වැය කර තිබුණි.

**4.9 ප්‍රසම්පාදන කටයුතු සහ කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අගුලාන නිවාස සංකීර්ණය ඉදිකරනු ලබන කොන්ත්‍රාත්කරුට සියයට 20 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලට අමතරව හා කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන මගින් එකඟ නොවූ රු. මිලියන 85 ක් අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අත්තිකාරම් ලෙස අධිකාරිය මගින් ගෙවා තිබුණි.

(ආ) අදාළ අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන සපයා නොගෙන ත්‍රිකුණාමල ප්‍රදේශයේ හා සීතාවක ප්‍රදේශයේ ඉදිකිරීමට නියමිත නිවාස ව්‍යාපෘති සඳහා අධිකාරිය විසින් පිළිවෙළින් රු. 747,754 ක් හා රු.2,395,289 ක වියදමක් දරා ඇති නමුත් මෙම නිවාස ව්‍යාපෘති අතර මග නවතා ඇති බව විගණනයේදී අනාවරණය විය.

13

(ඇ) නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා වැසිකිළි 466 ක් සාදා නිම කිරීමට රු. 15,000 ක ද්‍රව්‍යමය ආධාරද රු. 10,000 ක මූල්‍යමය ආධාරයක්ද වශයෙන් රු. මිලියන 6.1 ක් වැයකර තිබුණි. වැසිකිළි ඉදිකිරීම් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය පමණක් තෝරා ගෙන තිබූ නමුත් එම දිස්ත්‍රික්කය පමණක් තෝරා ගත් පදනම විගණනයේදී අනාවරණය නොවුණි. අධිකාරිය හා ප්‍රතිලාභීන් අතර තිබූ ගිවිසුම අනුව මාසයක් තුල වැසිකිළිය සාදා නිම කළ යුතු අතර එසේ නොවුනහොත් ලබා දුන් මුදල හා ගොඩනැගිලි ද්‍රව්‍ය වටිනාකම ණය මුදලක් සේ සලකා ප්‍රතිලාභියා විසින් අධිකාරිය වෙත එකවර ගෙවිය යුතු විය. එහෙත් වැසිකිළි සත්‍ය වශයෙන්ම නිමවා ඇති බවට හෝ වැසිකිළි සාදා නොමැති බව හඳුනාගැනීමට ක්‍රමවේදයන් අධිකාරිය සතු නොවුණි. ප්‍රතිලාභීන් 8 දෙනෙකුට මූල්‍යමය ආධාර පමණක් ලබාදී තිබුණද ගිවිසුම පරිදි වැසිකිළි සාදා නොමැති බැවින් එම මුදල් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

## 4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය රේඛීය අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති නිලධාරින් දෙදෙනෙකුගේ වැටුප් හා දීමනා ලෙස රු.306,830 ක් ගෙවා තිබුණි.

## 4.11 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 111 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 119 ක් වූයෙන් පුරප්පාඩු 15 ක් ද අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් 21 ක්ද විය.

(ආ) අධිකාරියේ ඉංජිනේරු තනතුරු 02 ක් අනුමත කර තිබුණද 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තනතුරු පුරප්පාඩුව් පවතින බැවින් ඉදිකිරීම් කටයුතු වල නියුතුව සිටින අධිකාරියට එම කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

(ඇ) අධිකාරියේ ප්‍රධාන තනතුරක් වන අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩුව පැවති අතර 2016 ජුනි වන විටත් එම තනතුර සඳහා නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 අනුව ආයතනයේ වර්තමානයේ පවතින සම්පත්, පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතිඵලවල ප්‍රගතිය, සංයුක්ත සැලැස්මේ ඒ ඒ කාර්යයන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් හඳුනාගැනීම යනාදී තොරතුරු ඇතුලත් කර සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලසුම තුල ඇතුලත් ක්‍රියාකාරකම් වලින් ඉටුකර ගත යුතු ප්‍රමාණයන්, ඒ ඒ කාර්යයන් සඳහා වගකීම් පැවරී ඇති නිළධාරීන් සහ කාර්ය සාධන ඇගයීම සඳහා වන දර්ශකයන් (Indicators) ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ සංවිධාන සටහනට අනුව අභ්‍යන්තර විගණක තනතුර මධ්‍යම ශ්‍රේණියේ තනතුරක් වීම හේතුවෙන් විගණනයේ කාර්ය සාධනයට හා ස්වාධීනත්වයට සෘජුව බලපා තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුල විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර අංශයේ කටයුතු වෙනුවෙන් අධිකාරියේ කළමනාකරණ සහකාර සේවයේ නිළධාරීන් දෙදෙනෙකුගේ සහය ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත විගණන වැඩසටහනෙහි ඇතුලත් ප්‍රජා හවුල්කාරීත්ව ඉදිකිරීම්, සෘජු ඉදිකිරීම් වලට අදාල විගණන වැඩසටහන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ කාර්යසාධන ඇගයීමට අදාල වැඩසටහන්, විගණන වැඩසටහන තුල අන්තර්ගතව නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

2015 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා ඇතැම් වියදම් විෂයයන් අයවැය ගත කර නොතිබුන අතර අයවැය ගත කරන ලද වියදම සත්‍ය වියදම සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 200 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද අධිකාරිය විසින් 2013 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) පූර්ව වර්ෂ ගැලපුම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. |
| | (ii) වත්කම්වල පිරිවැය නිවැරදි ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ඒවායේ වටිනාකම ඌන ගණනය වී තිබුණි. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | (i) අදාල කාර්යය නිමවූ සැනින් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ii) විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන එම අරමුණෙන් පරිබාහිර කටයුතු සඳහා භාවිතා කර තිබුණු අතර රාජ්‍ය ප්‍රදාන වලින් වියදම් නොකරන ලද ශේෂය භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය — අධිකාරියේ ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පැවති අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර තිබුණි. තවද ඇතැම් තනතුරු නිවැරදිව ශ්‍රේණිගත කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය — සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කරන ලද ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණු අතර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල පහල කාර්ය සාධනයක් නිරීක්ෂණය විය.එමෙන්ම රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ඇතැම් ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඉ) ණය පාලනය — ණය ගිවිසුම් ප්‍රකාරව ණය වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහල අගයක පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

17